# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1956/4 - 2016 පෙබරවාරි මස 29 වැනි සඳුදා - 2016.02.29

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පඩිපාලක සභා ආඥාපනත**

නිවේදනයයි

**රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව**

(136 වැනි අධිකාරය) පඩිපාලක සභා ආඥාපනතේ 30 වැනි වගන්තියෙන් තමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර මෙහි වූ උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් ස්වකීය තීරණයන් එම උපලේඛනයේ දක්වා ඇති පරිදි වෙනස් කිරීමට රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව යෝජනා කරන බව එකී පඩිපාලක සභා ආඥාපනතේ 28 වැනි වගන්තියේ විධිවිධාන අනුව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ඉහත කී යෝජනාවට දක්වෙන විරෝධතාවයන් 2016 මාර්තු මස 31 වැනි දින දහවල් 12.00 දක්වා එම පඩිපාලක සභාවේ සභාපති විසින් බාරගනු ලැබේ.

එබඳු වූ සෑම විරෝධතාවයක්ම ලියවිල්ලකින් විය යුතු අතර, ඒ විරෝධතාවය දැක්වීමට හේතු වූ කරුණු පිළිබඳ ප්‍රකාශයක් ද එහි අඩංගු විය යුතු ය.

එම්. ඩී. සී. අමරතුංග,<br>
සභාපති,<br>
රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය<br>
පිළිබඳ පඩිපාලක සභාව.

2016 පෙබරවාරි මස 29 වැනි දින,<br>
කොළඹ 05,<br>
කම්කරු දෙපාර්තමේන්තුවේ දී ය,

1A - G 23646— 09 (2016/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*උපලේඛනය*

රබර් වැවීමේ හා තැනීමේ කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් ඇති කරන ලදුව වර්ෂ 1949 නොවැම්බර් මස 25 වැනි දිනැති අංක 10047 දරන අතිවිශේෂ *ගැසට්* පත්‍රයෙහි පළකරනු ලැබූ නිවේදනයෙහි උපලේඛනයෙහි සවිස්තරව දක්වා ඇත්තා වූ ද, 2015 මැයි මස 05 වැනි දින අංක 1913/5 දරන *ගැසට්* පත්‍රයෙන් රබර් වැවීමේ හා දළ රබර් සැකසීමේ කර්මාන්තය ලෙස නැවත ස්ථාපිත කරන ලද ඉහත කී පඩි පාලක සභාවේ, ඉහත කී උපලේඛනයේ සඳහන් තීරණ වලට අදලව 2014 ජූලි මස 07 දිනැති අංක 1870/3 දිනැති අති විශේෂ *ගැසට්* පත්‍රයෙන් අවසන් වරට වෙනස් කරන ලද්දවූ ද තීරණ වල III කොටසේ (ඒ) හා (බී) කොටස් වෙනුවට පහත සඳහන් අලුත් කොටස ආදේශ කිරීමෙන් තවදුරටත් වෙනස් විය යුතු ය.

*II කොටස - අතිකාල ප්‍රමාණය*

වැඩ කරන සාමාන්‍ය දවසකට වැඩිපුර වැඩ කළ හැම පැයක්ම සම්බන්ධයෙන්ම ගෙවිය යුතු අවම අතිකාල ප්‍රමාණය වන්නේ (කාලම්මිමේ වැඩ සඳහා වූ දෛනික අවම පඩි ප්‍රමාණය 8න් බෙදීමෙන් නිශ්චය කරගත්) පැයකට ගෙවන අවම ප්‍රමාණය මෙන් 50%ක ගුණයකින් වැඩි වූ ප්‍රමාණයයි.

07-39

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.